**2025.07.01** අඟහරුවාදා


# ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය ප්‍රවෘත්ති සඟරාව

# லுணுகலை பிரதேச செயலக செய்தி மடல்

# LUNUGALA DIVISIONAL SECRETARIAT NEWS BULLETIN

www.lunugala.ds.gov.lk divseclunugala@gmail.com Divisional secretariat Lunugala


## කාන්තා හරසර ඇගයුම් උළෙල...















2025 ජාත්‍යන්තර කාන්තා දිනය නිමිති කරගෙන ලුණුගල කොට්ඨාසයේ දිරිය කාන්තාවන් ඇගයීම සඳහා කාන්තා හරසර ඇගයුම් උළෙල 2025.04.02 දින ප්‍රාදේශීය ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේදි පැවති අතර එදින ප්‍රධාන ආරාධිතයා වශයෙන් ඌව පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් නිමේෂා ප්‍රියංගි වනසිංහ මහත්මිය සහභාගි වූ අතර ප්‍රාදේශීය ලේකම්තුමා ඇතුළු කාර්යාලයේ මාණ්ඩලික නිලධාරින්,ආයුර්වේද වෛද්‍ය නිලධාරිතුමිය,පශු වෛද්‍ය නිලධාරිතුමිය,ගොවිජන සේවා සංවර්ධන නිලධාරි,බ/මිල්ලබැද්ද විද්‍යාලයේ විදුහල්පති,බ/කොට්ටල්බැද්ද විද්‍යාලයේ විදුහල්පති ,මහජන බැංකු කලමණාකරු,ලංකා බැංකු කලමණාකරු සහ ISD ආයතනයේ නිලධාරින් සහභාගි වු අතර ඔවුන් පිළිගැනීම ආද්‍යා රංග ආයතනය නර්ථන කණ්ඩායම විසින් සිදු කරන ලදි.

මෙහිදි ඌව පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්තුමිය සඳහා විශේෂ ඇගයීමක් සිදු කළ අතර ප්‍රාදේශීය ලේකම්තුමාගේ සංකල්පයකට අනුව රජය විසින් මහජනතාව වෙත කරනු ලබන කාර්යයන් සමාජගත කිරීම අරමුණුකොට ගෙන ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ප්‍රථම වරට සැකසූ කාර්තුමය ඊ සඟරාව ප්‍රාදේශීය ලේකම්තුමා විසින් ලේකම්තුමිය වෙත සහ පැමිණි ආරාධිත අමුත්තන් වෙත පිළිගැන්වීම සිදුවිය.

www.lunugala.ds.gov.lk වෙබ් අඩවියට පිවිස සඟරාව බාගත කර ගැනීමේ හැකියාව පවති.

මීට සමගාමීව කොට්ඨාසයේ විවිධ ආයතන වල මූලසුන හොබවන කාන්තා ප්‍රධානීන් සහ ස්වාමියා නොමැතිව තම ස්වොත්සහයෙන් ජීවිතය ජයගත් උත්සහවන්ත දිරිය කාන්තාවන් සඳහා සමරු පලක පිරිනමන ලදි. කාන්තා අයිතීන් පිලිබඳ බ/ලුණුගල ධම්මානන්ද දහම් පාසල හා බ/යපම්ම ධර්මානන්ද දහම් පාසල් අතර විවාද තරඟයක් පැවත්විනි.

මෙම වැඩසටහන සාර්ථක කරගැනීම සඳහා වර්ල්ඩ් විෂන් ආයතනය,I S D ආයතනය,මහජන බැංකුව,ලංකා බැංකුව.ධන ලක්ෂ්මි යන ආයතන අනුග්‍රහය ලබා දුන් අතර වනිතා සංවර්ධන නිලධාරිනිය හා උපදේශන නිලධාරිනිය විසින් වැඩසටහන සංවිධානය කරන ලදි.




මෙහෙයවීම -

- එස්.පුවනේන්ද්‍රන් මහතා - ප්‍රාදේශීය ලේකම්

උපදේශන කමිටුව -

- ඩබ්.ඒ.බී.පී.දයානන්ද මිය - සහකාර අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන )
- ඒ.එම්.අයි.ප්‍රියදර්ශනි මිය - පරිපාලන නිලධාරි
- ආර්.එම්.කීර්තිනන්ද රාජපක්ෂ මහතා - පරිපාලන ග්‍රාම නිලධාරි

සකස් කළේ -

- ඩී.එම්.ප්‍රභාත් දිසානායක මහතා - කළමනාකරණ සේවා නිලධාරි

පරික්ෂා කළේ-

- ඩබ්.ඒ.බී.පී.දයානන්ද මිය - සහකාර අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන )
- එස්.රාජදුරෙයි මහතා - ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි

# ජනාධිපති අරමුදල

ඔබ සැත්කම / ප්‍රතිකාර ලබා ගැනීමෙන් පසුව මූල්‍යාධාර අයදුම් කර ඇත්නම් ජනාධිපති අරමුදල විසින් ඔබ මූල්‍යාධාර ලබා ගැනීමේ සුදුස්සෙක් ලෙස තෝරා ගනු ලැබුවහොත් ඔබට අදාළ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය හරහා මුදල් ලබාගත හැකිවේ.

ඔබ සැත්කම /ප්‍රතිකාර කිරීමට පෙර මූල්‍යාධාර අයදුම් කර ඇත්නම් ජනාධිපති අරමුදල විසින් ඔබ මූල්‍යාධාර ලබාදීමට සුදුස්සෙකු ලෙස තෝරා ගනු ලැබුවහොත් සැත්කමට / ප්‍රතිකාරයට නියමිත දිනට පෙර අදාල රෝහල වෙත අනුමත මුදල දක්වමින් වගකීම් ලිපියක් ජනාධිපති අරමුදල විසින් යොමු කරනු ලබයි.

ජනාධිපති අරමුදලට අයදුම් කිරීම සඳහා ,

WWW.PRESIDENTSFUND.GOV.LK වෙබ් අඩවිය මගින් බාගත කිරීමෙන් හෝ QR කේතය මගින් අයදුම්පත් ලබා ගත හැක.

ජනාධිපති අරමුදල සඳහා අයදුම් කළ යුත්තේ,

- සැත්කමට /ප්‍රතිකාරයට දින 30 කට පෙර අයදුම් පත්‍රය භාරදිය හැකිය.
- සැත්කම හෝ ප්‍රතිකාරය සිදු කර රෝහලෙන් බැහැර වී දින 60 ක් ඉක්මවීමට පෙර භාරදිය හැකිය.

ජනාධිපති අරමුදල සඳහා අයදුම් කිරීමේදි අවශ්‍ය ලේඛන,

- රෝගයට අදාළ වෛද්‍ය නිර්දේශයේ මුල්පිටපත
- සැත්කමට / ප්‍රතිකාරයට පෙර අයදුම් පත්‍රය භාර දෙන්නේ නම් ,සැත්කම/ ප්‍රතිකාරය සඳහා යන වියදම් ඇස්තමේන්තුවේ මුල් පිටපත
- සැත්කම/ප්‍රතිකාරයට පසු අයදුම් පත්‍රය භාරදෙන්නේ නම්,සැත්කම/ප්‍රතිකාරයට අදාළ ගෙවීම්වල මුල් කුවිතාන්සිපත්
- රෝගියාගේ හා පවුලේ අයලගේ බැංකු ගිණුම් වාර්ථා
- රෝගියාගේ ජාතික හැඳුනුම්පතෙහි ඡායාපිටපතක්
- රෝගියාගේ හා පවුලේ සාමාජිකයන්ගේ ආදායම් විස්තර
- දිවුරුම් ප්‍රකාශ
- ණය ලබා ගැනීම,රන් භාණ්ඩ උකස් කිරීම් වේ නම්,තහවුරු කරන ලේඛන පිටපත්
- අවශ්‍ය වෙනත් ලේඛන

මේ සම්බන්ධව වැඩිදුර විස්තර ලබා ගැනීම සඳහා

- ඔබ පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි මගින්
- ඔබ පදිංචි ප්‍රදේශයට අයත් ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින්
- ජනාධිපති අරමුදල ඇමතීමෙන් දු.ක. 0112354354

WWW.PRESIDENTSFUND.GOV.LK

“අපි සැමවිටම අවංකව හා සත්‍යවාදීව කටයුතු කර ප්‍රතිලාභ අවැසිනම් පමණක් ලබා ගනිමින් අනාගතයේ රෝගිවන පුද්ගලයෙක්ගේ,අපේ ඥාතියෙකුගේ ජීවිතය සුරැකීමට






## සංස්කෘතික

## හෙළයට ජීවගුණය කැඳවූ ජනකෙළි හා අවුරුදු චාරිත්‍ර





අවුරුදු චාරිත්‍ර හා ජනකෙළිවල සංස්කෘතිකමය සන්නිවේදනයන් පිළිබඳ දැනුවත්වීම වර්තමාන සමාජයේ විවේකී ගොස් ඇති ජනකෙළි පිළිබඳ දැනුවත් කිරීම හා දරුවන්ට ප්‍රායෝගිකව ක්‍රීඩා කිරීමට අවස්ථාව ලබාදීම මෙහිදී සිදු කරනු ලැබීය. අවට පරිසරය හා බැදෙමින් පරිසරයෙන් ලබා ගන්නා දේ මගින් ක්‍රීඩාවන්හි යෙදීම එකමුතුකම හා ජීවිතයට පාඩම් උපදෙස් ක්‍රීඩාවන් මගින් ලබාගත හැකි බව දැනුවත් කිරීම, අවුරුදු චාරිත්‍ර සමාජයෙන් වියකී ගොස් ඇති පරණ අවුරුදු චාරිත්‍ර හා එම චාරිත්‍රයන් සිදුකිරීමෙන් අදහස් වන්නේ කුමක්ද සිදුකිරීමට හේතු ආදිය පිළිබඳ පාසල් දරුවන් දැනුවත් කිරීමේ වැඩසටහනක් සංස්කෘතික නිලධාරිනියගේ මෙහෙයවීමෙන් බ/ පල්ලෙකිරුව හා වේරගොඩ යන විද්‍යාලවලදී පැවැත්විණි.අතර මේ සඳහා පාසල් විදුහල්පතිවරු හා ගුරු මණ්ඩලයද සහභාගි වූ අතර සම්පත් දායකත්වය බදුලු දිස්ත්‍රික් සංස්කෘතික අපි කණ්ඩායම විසින් සපයන ලදි.

## "කියවමු - විදිමු - නිමවමු"








සොඳුරු සංස්කෘතික දරුවෙකු බිහි කරලීම සඳහා හරවත් ළමා සාහිත්‍ය තුළින් ලැබෙන දායකත්වය පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කර ඔවුන්ගේ නිර්මාණශීලී කුසලතාවයන් වර්ධනය කිරීමට අවැසි මග පෙන්වීම ලබාදීම හා ඔවුන් නිර්මාණකරණයට යොමු කිරීම අරමුණු කරගෙන "සංස්කෘතික අපි" කණ්ඩායම නිර්මාණය කළ "කියවමු - විදිමු - නිමවමු" රස වින්දනාත්මක දැනුවත් කිරීමේ වැඩසටහනේ ආරම්භක වැඩසටහන අද දින (2025.05.28) ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බ/ලුණුගල මධ්‍ය මහා විද්‍යාලයේ දරුවන් උදෙසා එම විද්‍යාලීය ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී.

මෙහිදී ළමා සාහිත්‍යයේ අන්තර්ගතය, ළමා සාහිත්‍ය පරිශීලනය තුළින් දරුවන්ට ලැබෙන වාසි හා ඒ තුළින් දරුවන්ගේ නිර්මාණශීලී චින්තනය වර්ධනය කරගන්නේ කෙසේද යන්න පිළිබඳව සිසු දරුවන්ට මනා අවබෝධයක් ලබාදීමට හැකි වූ බව වැඩසටහන අවසානයේදී ඔවුන් ප්‍රකාශ කළ අදහස් වලින් පැහැදිළි විය.

ඌව පළාත් සංස්කෘතික අමාත්‍යාංශයේ මූල්‍ය අනුග්‍රහය මත පැවැත් වූ මෙම වැඩසටහන සඳහා බදුල්ල දිස්ත්‍රික් සංස්කෘතික නිලධාරී චන්දික රත්නායක, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංස්කෘතික නිලධාරී නදීකා තිලංගනී පිළිවෙලින් බණ්ඩාරවෙල, වැලිමඩ හා ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සංස්කෘතිය නිලධාරීන් වන තනුජා ප්‍රභාණී, චන්ද්‍රා ප්‍රියදර්ශනී හා දිලංගනී ලක්මාලි සම්පත් දායකත්වය ලබා දෙන ලදී.

**සමාජ සේවා හා සමාජ සුබසාධන**

## ඉටු කරමු යුතුකම්,රැක ගනිමු හිමිකම්

ඉටු කරමු යුතුකම්,රැක ගනිමු හිමිකම් නිලධාරී කාර්යාලයේ මහජන සෞඛ්‍ය පිළිබඳව දරුවන් බලගැන්වීමේ වැඩ පරික්ෂක තිරාජ් මහතා හා නිශ්ශංක සටහනක් ප්‍රාදේශීය ලේකම්තුමාගේ මහතා ප්‍රමුඛ කණ්ඩායම හා ළමා උපදෙස් පරිදි 2025.04.10 වන දින හිමිකම් ප්‍රවර්ධන නිලධාරි විසින් ලුණුගල ජාතික පාසලේ දී පැවැත් වූ ලබාදෙන ලදි. මේ සඳහා පරිවාස හා අතර පරිවාස හා ළමාරක්ෂක සේවා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක රු.10000.00 ක මූල්‍ය ප්‍රතිපාදන කරන ලද වැඩ සටහනකි.මෙම ලබාදෙන ලදි.
වැඩසටහන සඳහා සම්පත්දායකත්වය
ලුණුගල ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය



## මා පිය සෙනෙහස සොයා ...

මා පිය සෙනෙහස අහිමි වූ වෙනත් භාරකාරත්වයක් යටතේ රැකවරණය ලබමින් සිටි පොඩි දරු පැටියකුට නැවත මව්පිය සෙනෙහස ලබාදීමට අවශ්‍ය මංපෙත් විවර කරමින් දරුපැටියාගේ දෙමව්පියන් සොයාගනිමින් ඔවුන් කාර්යාලයට ගෙන්වා ගනිමින් 2025.05.19 වන දින ඔවුන්ගේ විවාහය කාර්යාලයේ දී සිදු කිරීමට ප්‍රාදේශීය ලේකම්තුමා ගත් උත්සාහය මල්ඵල දැරූ අවස්ථාව .





## දරුවන්ගේ දන්සල



වෙසක් පොහොය දින ළමා සමාජ දරුවන්ගේ එකමුතුවෙන් සහ දරුවන්ගේ වෙහෙස මහන්සියෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමියේ සංවිධානය කරන ලද කඩල දන්සල අති සාර්ථකව පැවැත්වූ අතර මේ සඳහා අවශ්‍ය සහය ප්‍රාදේශීය ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලය විසින් ලබාදෙන ලදි.

## පාසල් නොයන දරුවන් නැවත පාසල්ගත කිරීම ...

ලුණුගල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ බ/ අල් අමීන් විදුහලේ පාසල් නොයන බවට හඳුනාගත් ලුණුගල නගර වසමෙහි පදිංචි දැරියන් පිරිසක් හා එම දැරියන් ගේ භාරකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහනක් 2025 .05.19 වන දින ප්‍රාදේශීය ලේකම්තුමා ගේ ප්‍රධානත්වයෙන් පැවත්විණි.



**සමාජ සේවා හා සමාජ සුබසාධන**

## ආන්තික දරුවන් සඳහා ...

පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව හා ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්‍යාලය එක්ව ආන්තික දරුවන් සඳහා වන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යටතේ බටවත්ත, කොකාගල වතු ආවරණය වන පරිදී බ/බටාවත්ත විද්‍යාලයේ 2025.06.20 දින පැවැත්වූ එක්දින කඳවුර සාර්ථක ලෙස පවත්වන ලදි. මේ සඳහා සම්පත් දායකත්වය ලබා දෙන ලද්දේ මඩකලපුව උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂක සෙල්වරත්නම් ජෙයපාලන් මහතායි.



## මත් රකුසා



පාසල් නොයන දරුවන් සඳහා බ/බටවත්ත දෙමළ විද්‍යාලයේ පැවැත්වූ දැනුවත් කිරිමේ වැඩසටහනේ දී මත්ද්‍රව්‍ය දූර්භාවිතය හා ජාවාරම පිළිබඳව දැනුවත් කිරිම සිදු කරන ලදී.

## හේතු විමසීම ...

බ/බටවත්ත විද්‍යාලයේ පාසල් පැමිණීම අඩු දරුවන්ගේ දෙමාපියන් සමග පාසල් නොපැමිණීමට හේතු පෞද්ගලිකව හඳුනා ගැනීම හා ඒවාට විසඳුම් සාකච්ඡා කිරීම 2025.06.20 දින සිදු කෙරිණි.



## පොසොන් පෙරහැර

2025 වර්ෂයේ පොසොන් පොහොය නිමිත්තෙන් යපම්ම ශ්‍රී රම්‍ය විජයරාම විහාරස්ථානයේ සතර පේරුවේ දායකයින් හා යපම්ම දහම් පාසලේ දරුවන්ගේ එකමුතුවෙන් සංවිධානය කළ දර්ශනීය පෙරහැර යපම්ම විහාරස්ථානයේ සිට වෙල්ලවෙල දක්වා ප්‍රධාන මාර්ගයේ ගමන් කරන ලදි.ප්‍රදේශයේ බෞද්ධ බැතිමතුන්ගේ බෞද්ධාලම්භන ප්‍රීතිය ඇති කිරීම සඳහාත් මිහිඳු මාහිමියන්ගේ ලංකා ගමනයත් සමඟ මෙරට දායාද වූ උතුම් ශ්‍රී සද්ධර්මයට නමස්කාර කිරිමේ ප්‍රීතියන් පෙරදැරිව මෙම වාර්ෂික පෙරහැර සංවිධානය කරන ලදි.







# සමාජ සේවා හා සමාජ සුබසාධන

## සෙනෙහසේ නවාතැන





සෙනෙහසේ නවාතැන වැඩසටහන යටතේ ඌව පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යුනිසෙෆ් ව්‍යාපෘතිය මගින් රු. 400 000 මූල්‍යාධාර යොදවා පීස්සගම වසමේ අවධානම් සහිත දරු පවුලකට නිවහනක් ඉදිකර දීමේ කටයුතු ප්‍රාදේශීය ලේකම්තුමාගේ උපදෙස් හා මග පෙන්වීම යටතේ ආරම්භ කරන ලදි.

## ගුරු උපහාර උළෙල

‘‘තුඩින් තුඩ ගුරු පෙමින් ‘‘

‘‘රස කළා සිප් කිරෙන් ‘‘

‘‘අම දිය පොවා ‘‘

‘‘පුංචි සමනල් පැටවුන්ට’’

‘‘අත්තටු සවි කරන්නට’’

වෙහෙස වූ පෙර පාසල් ගුරු මවුන් ඇගයීමේ උපහාර උළෙල 2025 ක් වූ ජුනි මස 18 වන දින ප්‍රාදේශිය ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේදි අති උත්කර්ෂවත් ලෙස පැවැත්විණි.





## පහන් පූජා පිංකම ...

ප්‍රෞඪ ඉතිහාසයක සාඩම්බර උරුමක්කරුවන් ලෙස බුදු දහමින් සුපෝෂිත ජාතියක් වශයෙන් පින්බර පොසොන් උත්සවයට සමගාමීව ප්‍රාදේශිය වැඩිහිටි බල මණ්ඩලය හා සමාජ සේවා අංශය විසින් සංවිධානය කරන ලද භාවනා වැඩසටහන හා පහන් පූජා පිංකම 2025.06.09 වන දින කාර්යාල පරිශ්‍රයේ දි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් 50 දෙනෙකුගේ සහභාගිත්වයෙන් පවත්වන ලදි.

ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වසම් මට්ටමින් පිහිටුවා ඇති වැඩිහිටි සමිති සක්‍රිය කොට බල ගැන්වීම,මනසින් ශක්තිමත් ජ්‍යෙෂ්ඨ පුරවැසි ප්‍රජාවක් බිහි කිරීම,ජීවිත යථාර්ථය පසක් කොට දෙමින් මෙලොව පරලොව දියුණුව සලසා ගත හැකි බව අවධාරණය කොට දීම හා තව තවත් මෙවැනි වැඩසටහන් වලට සහභාගිවීමේ අභිප්‍රාය වැඩි දියුණු කිරීම අරමුණයි.





## CLEAN SRI LANKA

ජගත් පරිසර දිනට සමගාමීව හොප්ටන් හා රේන්දපොල වසම කේන්ද්‍ර කර ගනිමින් කසළ විධිමත් ව බැහැර කිරීම සම්බන්ධව ප්‍රජාව දැනුවත් කිරීම, ප්‍රධාන මාර්ගය හා ඒ අවට පිරිසිදු කිරීම APPOLO පදනමෙහි අනුග්‍රහය හා සහයෝගය මත ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය රෝහල හොප්ටන්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය, ලුණුගල ප්‍රාදේශීය සභාව,ලුණුගල පොලිස් ස්ථානය හා බ/ කලෙයිමගල් විද්‍යාලය යන සියලුම ආයතන නියෝජනය කරමින් 2025.06.18 වන දින ක්‍රියාත්මක කරන ලදී.





**සමාජ සේවා හා සමාජ සුබසාධන**

## පෙර පාසල් දරුවන්ගේ පෝෂණ මට්ටම ඉහල නැංවීම







ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පෝෂණ තත්වය ඉහළ නංවාලීම සඳහා පෙර පාසල් වල පෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන් මාලාවේ වැඩසටහන් කිහිපයක් අලකොලගල පිපෙන කැකුළු පෙර පාසල,යපම්ම සරණ සිහිනි පෙර පාසල ,රන් දරු තරු,කැකුළු යන පෙර පාසල් මූලිකව සාර්ථකව පවත්වන ලදි.මුල්ළමාවිය සංවර්ධන නිලධාරියගේ දරුවන්ගේ සම්බන්ධීකරණයෙන් අයුර්වෙද වෛද්‍යතුමියගේ සම්පත්දායකත්වයෙන් වැඩසටහන ක්‍රියාත්මක කළ අතර දරුවන්ගේ පෝෂණ මට්ටම ඉහළ නංවාලමින් ඔවුන්ගේ කායික මානසික සෞඛ්‍ය නංවාලමින් යහපත් පරපුරක් බිහිකිරීම මෙම වැඩසටහන් මාලාවේ අරමුණයි.

## ප්‍රථමාධාර







ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පෙර පාසල් ගුරුවරුන් උදෙසා ප්‍රථමාධාර පුහුණු වැඩමුළුවක් මුල් ළමාවිය සංවර්ධන නිලධාරිනිය හා සංවර්ධන නිලධාරිගේ සම්බන්ධීකරණයෙන් බදුල්ල ආපදා සහන සේවා ඒකකය හා රතු කුරුස සංවිධානයේ සම්පත්දායකත්වයෙන් පවත්වන ලද අතර මෙම වැඩමුළුව වර්ල්ඩ් විෂන් ලංකා ආයතනයේ මූල්‍ය අනුග්‍රහයෙන් සිදු කරන ලද අතර පෙර පාසල් තුළ දරුවන්ට සිදුවන අනතුරු අවම කිරිම හා අනතුරක් සිදුවුවහොත් ක්‍රියාත්මක වෙන ආකාරය ගුරුවරුන් හට පුහුණු කරන ලදි.

## පෝෂණීය ආහාර වේලක්









පෙර පාසල් දරුවන්ගේ පෝෂණ අවශ්‍යතා සපුරාලමින් බුද්ධිමත් දරු පරපුරක් බිහි කරනු ලබාදෙන උදෑසන ආහාරවේල වැඩසටහන නිවැරදිව ක්‍රියාත්මක වේදැයි කොට්ඨාසයේ සියලුම පෙර පාසල් වස් පරික්ෂාවක් මුල් ළමාවිය සංවර්ධන නිලධාරිනිය විසින් සිදු කරන ලදි.

## ශ්‍රමදාන වැඩසටහන

ලෝක පරිසර දිනය වෙනුවෙන් පෙර පාසල් දරුවන්ගේ ආකල්ප සංවර්ධනය කිරීම වෙනුවෙන් සුමුදුගම ක්‍රීඩාංගනය හා එහි අවට පිරිසිදු කිරීම 2025.03.03 වන දින සුමුදුගම ප්‍රාදේශීය සභා පෙර පාසලේ දරුවන්ගේ හා ගුරුවරුන්ගේ සහභාගිත්වයෙන් පැවැත්වුණි.





# සමාජ සේවා හා සමාජ සුබසාධන

## පරිසරයට ආදරය කරමු ...





පරිසර සතියට සමගාමීව ලුණුගල කොට්ඨාසයේ සියලුම පෙර පාසල්වල පෙර පාසල් දරුවන් , ගුරුවරුන් හා දෙමව්පියන් සහභාගි කොට ගෙන 2025.06.03 වන දින පෙර පාසල් අවට පිරිසිදු කිරීම් සිදු කිරීම. පරිසරය පිරිසිදුව තබා ගැනීමේ වැදගත්කම හා පරිසරයට ආදරය කිරීම තුළින් ලැබෙන ප්‍රතිලාභ දරුවන්ට අවබෝධ කරලමින් ආකල්ප සංවර්ධනයක් ඇති කිරීම මෙහි අරමුණ වේ.

## ආපදා කළමණාකරන වැඩසටහන

මඩුවත්ත ග්‍රාම නිලධාරි වසමේ පරණ කර්මාන්ත ශාලාව බී කොටසට අදාළව පසුගිය කාලයේ ඇතිවූ නායයෑම් අවදානම් තත්වයමත ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් අධි අවදානම් ලෙස වාර්තා ලබා දි ඇති පවුල් 110 ක් සඳහා ආපදා කළමනාකරණ පුහුණු වැඩසටහනක් අදියර 02 ක් යටතේ 2025.06.04 හා 06 දිනයන්හි මඩුවත්ත බ/ විග්නේශ්වරා විද්‍යාලයේදි පැවැත්විණි.

මෙම වැඩසටහන බදුල්ල දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකය හා ලුණුගල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය එක්ව සංවිධානය කරන ලදි.









## අවදානමට පෙර සූදානම...

2025 වර්ෂයේ මෙම කොට්ඨාසයේ ආපදා අවදානම අවම සමන්විත ග්‍රාම නිලධාරි වසම් මට්ටමේ ආපදා කළමනාකරණ කිරීම හා පෙර සූදානම් වැඩසටහන් සිදු කිරීමට අදාළව සැලසුම් සකස් කිරීමේ වැඩසටහනක් 2025.04.01 සහ 07 ක්‍රියාත්මක වන පුහුණු වැඩසටහන් මාලාවේ දින තුනකින් වන දින ප්‍රාදේශිය ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේදි





## දරුවන්ගේ දෙමව්පියන් දැනුවත් කිරීම...





පෙර පාසල් දරුවන්ගේ දෙමව්පියන් දැනුවත් කිරීමේ වැඩසටහන පරිසරයට ඇළුම් කරන දරු පරපුරක් බිහි කරනු වස් දෙමව්පියන් දැනුවත් කරලීමේ වැඩසටහන **2025.06.04** වන දින ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේදි පැවති අතර මෙම වැඩසටහන සඳහා සම්පත්දායකත්වය පරිසර නිලධාරි හා ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ පර්යේෂණ සහකාර නිලධාරින් දෙපල විසින් ලබාදුන් අතර සම්බන්ධීකරණය මුල් ළමාවිය සංවර්ධන නිලධාරිතුමිය විසින් සිදු කෙරිණි.

## දලුළලන්න ඉඩ දෙන්න ...

දලුළන්න ඉඩ දෙන්න පෙර පාසල් වල සෑම දරුවෙකු නමින්ම පැළයක් රෝපණය කිරීමේ වැඩසටහන ලුණුගල කොට්ඨාසයේ සියලුම පෙර පාසල්වල ක්‍රියාත්මක කළ අතර හොප්ටන් බ්‍රයිට්නස් පෙර පාසලේ එහි සමාරම්භක උළෙල **2025.06.05** වන දින ප්‍රාදේශිය ලේකම්තුමාගේ මූලිකත්වයෙන් සිදු කරන ලදි.









## මනෝ සමාජීය වශයෙන් සවිබල ගැන්වීම ...






සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රජාව සවිබල ගැන්වීමේ ජාතික වැඩසටහනට අදාළව ප්‍රජාව මනෝ සමාජීය වශයෙන් සවිබල ගැන්වීමේ ජාතික වැඩසටහනට අදාළව ප්‍රජාව මනෝ සමාජීය වශයෙන් සවිබල ගැන්වීම සඳහා ක්ෂේත්‍ර නිලධාරින් පුහුණු කිරීමේ වැඩසටහන් **03** ක් **2025.06.06** වන දින පස්සර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේදි පැවැත්වූ අතර පස්සර,ලුණුගල කොට්ඨාස දෙකේ සමෘද්ධි සංවර්ධන නිලධාරින් සහ ව්‍යාපෘති කළමණාකරුවන් පුහුණු කිරීම එදින සිදුවිය.

එහි දෙවන වැඩසටහන වන ඔබේ ජීවිතයේ අභියෝග,ධනාත්මක චින්තනය හා නොපසුබට උත්සහය අවබෝධ කර ගැනීමට අදාළ දේශනය ලුණුගල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ උපදේශන සහකාර නිලධාරිතුමියගේ සම්පත්දායකත්වයෙන් පැවැත්විණි.

මෙහිදි ජීවන අභියෝග හඳුනාගැනීමේ වැදගත්කම,අභියෝග ජයගන්නේ කෙසේද,අභියෝග ජයගැනීමේ ක්‍රම මොනවාද යන්න ප්‍රායෝගික ක්‍රියාකාරකම් ආශ්‍රිතව දැනුවත් කිරීම සිදුවිය.

**සමාජ සේවා හා සමාජ සුබසාධන**

## වතුකරයට පෝෂණය










ලුණුගල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ 2025 වර්ෂය සඳහා වතු ආශ්‍රිත ජනතාවගේ පෝෂණ, සමාජීය හා සෞඛ්‍ය තත්වය ඉහළ නැංවීමේ වැඩසටහන් මාලාවේ පළමු වැඩසටහන 2025.05.18 වන දින අඩාවත්තේදි පැවැත්වුණි. මෙම වැඩසටහන තුළින්,ආයුර්වේද වෛද්‍ය සායනය,ආයුර්වේද ඔසුපැන් ලබාදීම,අඩු වියදම් පෝෂණීය ආහාර සැකසුම් ප්‍රායෝගික වැඩසටහන හා පෝෂණීය ආහාර ලබාදීම හා පෝෂණය හා ලිංගික අධ්‍යාපනය ,සෞඛ්‍යය පිළිබඳ දේශනයක් පැවැත්වුණි.

මෙම වැඩසටහන සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රී කිට්නන් සෙල්වරාජ් මහතා,ඌව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ලේකම්,කොමසාරිස්,වෛද්‍ය නිලධාරි කාර්යය මණ්ඩලය,ලුණුගල ආයුර්වේද රෝහලේ වෛද්‍යතුමිය,වසමේ ග්‍රාම නිලධාරි හා සංවර්ධන නිලධාරි,වැවිලි ප්‍රජා සංවර්ධන නිලධාරි හා අඩාවත්ත වතු අධිකාරි යන මහත්ම මහත්මින් ද සහභාගි විය.මෙම වැඩසටහන සඳහා ඌව පළාත් ආයුර්වේද

## 16 වන ජාතික රණවිරු සැමරුම...









යුද බියෙන් ගිනි වැදුණු මරණයේ දේශයට
ජීවයේ සුසුම් පොද දිවි පුදා ගෙන දුන්
වැදූ මවට දිනු බිමට ණය නොවූ පුතුනුවනි
බිඳුණු බිම එකතු කළ සැබෑ විරුවන් නුඹය......
නමුණුකුල ලෙසින් නුඹ අභිමන්‍ය මේ බිමට
සොඳුරු දුන්හිඳ ලෙසින් පැහැබරය නුඹ මතක
හෙළ බිමක් මිහිතලේ පවතිනා තුරාවට
කිසි දිනෙක නොමියෙනා සැබෑ විරුවන් නුඹය......

**16** වැනි ජාතික රණවිරු දින සැමරුමට සමගාමීව ලුණුගල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ දිවිපිදූ වීරෝධාර රණවිරුවන් අනුස්මරණය කිරීමේ උත්සවයක් ප්‍රාදේශිය ලේකම්තුමා සහ රණවිරුවන්ගේ පවුලේ අයගේ සහභාගිත්වයෙන් 2025.05.19 වන දින කාර්යාලයේ රණවිරු ස්මාරකය අභියස පවැත්වූහ.

## මතින් තොර රටක්.....









මත්ද්‍රව්‍ය අබ්බැහියේ අහිතකර බලපෑම පිලිබඳ පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් 2025.05.20 වන දින බ/විග්නේෂ්වරා දෙමළ මහා විද්‍යාලයේදි පැවැති අතර මෙහිදි විද්‍යාලයේ 10 ශ්‍රේණියේ සිසුන් 40 ක් සඳහා මත්ද්‍රව්‍ය ඇබ්බැහිය,එහි අහිතකර බලපෑම අවම කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග පිළිබඳ දැනුවත් කිරීම සිදුවිය.

මෙම වැඩසටහන සඳහා ලුණුගල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ උපදේශන සහකාර නිලධාරිනිය විසින් සම්පත්දායකත්වය සැපයූ අතර හොප්ටන් ප්‍රජා ශක්ති ආයතනය විසින් සංවිධානය කරන ලදි.

## වැඩිහිටි අවුරුදු උත්සවය






ලුණුගල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ වැඩිහිටි සමිති සාමාජික සාමාජිකාවන් 100 කගේ සහභාගිත්වයෙන් ලුණුගල ප්‍රාදේශිය ලේකම් කාර්යාල භූමි පරිශ්‍රයේදි උත්කර්ශවත් ලෙස 2025 වර්ෂයේ අප්‍රේල් මස 29 දින දවස පුරා පැවැත්වු අතර මේ සඳහා ප්‍රාදේශිය ලේකම්තුමා ඇතුළු නිලධාරින්,ආරාධිත අමුත්තන් සහභාගි විය.

කොට්ඨාසයේ සක්‍රිය වැඩිහිටි සමිති තව දුරටත් සක්‍රිය කිරීම හා අක්‍රිය තත්වයේ පවතින වැඩිහිටි සමිති සඳහා පූර්වාදර්ශ සැපයීම, කොට්ඨාසයේ ජොෂ්ඨ පුරවැසි කුසලතා එළිදැක්වීම සඳහා අවස්ථාව සැලසීම,කොට්ඨාසයේ ජේෂ්ඨ පුරවැසියන්ගේ මානසික ආතතිය, මානසික ව්‍යාකූලත්වය, ඉච්ඡා බංගත්වය දුරලා ඉතා යහපත් මානසික සුවබරතාවයකින් යුක්ත ශක්තිමත් මනෝභවයක් සහිත නිරෝගිමත් ජොෂ්ඨ පුරවැසි ප්‍රජාවක් සමාජගත කිරීම හා සතුට ඇත්තෝ අතීතයේ හෝ අනාගතයේ නොව වර්තමානයේ බව ඔවුන්ට අවබෝධ කර දීම මෙහි අරමුණයි.

මෙම වැඩසටහන ඌව පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන මත සමාජසේවා අංශය මගින් සංවිධානය කරන ලදි.

## එයාලටත් අවුරුදු ...

ලුණුගල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ ස්වශක්ති ආබාධිත විශේෂ අවශ්‍යතා සහිත වූවන්ගේ සංගමයේ සාමාජික සාමාජිකාවන් 125 කගේ සහභාගිත්වයෙන් ලුණුගල ප්‍රාදේශිය ලේකම් කාර්යාල භූමි පරිශ්‍රයේදි උත්කර්ශවත් ලෙස 2025 වර්ෂයේ අප්‍රේල් මස 29 දින දවස පුරා පැවැත්වු අතර මේ සඳහා ප්‍රාදේශිය ලේකම්තුමා ඇතුළු නිලධාරින්,ආරාධිත අමුත්තන් ද සහභාගි විය.

කොට්ඨාසයේ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සම්බන්ධවූ ස්වශක්ති සංගමයේ සියලු සාමාජිකයන්ගේ හැකියාවන් ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසාදීම තුළින් කුසලතා පරිපූර්ණ ජන කොට්ඨාසයක් සමාජගත කිරීම,සාමාන්‍ය ප්‍රජාව සේම විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ද සමාජයට ඉතා වටිනා ජන කොටසක් බවත් එසේම ඔවුන් සමාජ කොන් වූ ජන ප්‍රජාවක් බවට ඔවුන් තුළ ඇති හීනමානය දුරු කිරීම,විශේෂ අවශ්‍යතා සහිත ප්‍රජාවගේ මානසික ආතතිය දුරලා සෞඛ්‍ය සම්පන්න ජන කොට්ඨාසයක් බවට පත් කිරීම,සතුට ඇත්තෝ අතීතයේ හෝ අනාගතයේ නොව වර්තමානයේ බවත් මේ මොහොතේ සතුටින් සිටීමේ වැදගත්කම හා ආත්ම අභිමානයෙන් පරිපූර්ණ විහේෂ ආබාධිත පුරවැසියන් බිහි කිරීම මෙහි අරමුණයි.

මෙම වැඩසටහන ඌව පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන මත සමාජසේවා අංශය මගින් සංවිධානය කරන ලදි.






## සමාජ සේවා හා සමාජ සුබසාධන

### සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප



සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් ක්‍රමය පිලිබද ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහනක් 2025.05.27 වන දින මඩුවත්ත වසම තුළදි පැවැත්වුණි. මෙම වැඩසටහන වසමේ ග්‍රාම නිලධාරි හා සංවර්ධන නිලධාරි විසින් සංවිධානය කළ අතර ලුණුගල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සමාජ ආරක්ෂණ නිලධාරි එස්.ඩී.එන්. සජීවනි මහත්මිය විසින් සම්පත්දායකත්වය ලබාදෙන ලදි.

### කාන්තා කාර්යය සංවිධානය



සූරියගොඩ වසමේ දෙමළ කාන්තාවන් සඳහා කාන්තා කාර්ය සංවිධානය පිහිටුවීම සිදු කළ අතර එම කාන්තාවන් සඳහා ස්වයංරැකියා කිරීමට අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම සිදු කරන ලදි.

### මතින් තොර රටක්.....




අඩාවත්ත ප්‍රජාශක්ති ආයතනය විසින් සංවිධානය කරන ලද මත් ද්‍රව්‍ය ඇබ්බැහිවීම හා එහි බලපෑම වැළැක්වීමට ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් බ/තිරුමගල් දෙමළ විද්‍යාලයේ 9,10,11 ශ්‍රේණිවල සිසුන් 38 දෙනෙකුගේ සහභාගිත්වයෙන් 2025.05.30 දින අඩාවත්ත ප්‍රජා ශක්ති ආයතනයේදී පැවැත්විණි.

මේ සඳහා සම්පත්දායකත්වය ලුණුගල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ උපදේශන සහකාර නිලධාරීනිය විසින් ලබාදෙන ලදි.

### කාන්තා බල මණ්ඩලය



කාන්තා බල මණ්ඩල රැස්වීම 2025.05.28 වන දින ලුණුගල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දි පැවති අතර එහිදි අයුර්වේද වෛද්‍යතුමිය විසින් ආහාර සුරක්ෂිතතාවය පිළිබඳව දැනුවත් කිරීමක් සිදුකළ අතර දේශිය ආහාර තරගාවලියක් පැවැත්වීමට කටයුතු සංවිධානය කර ගන්නා ලදි.

සමාජ සේවා හා සමාජ සුබසාධන

## විගමණික ශ්‍රමිකයින්ගේ දරුවන්ගේ භාරකාරීත්වය දැනුවත් කිරීම






විගමණික ශ්‍රමිකයින්ගේ දරුවන්ගේ භාරකාරීත්වය, ආරක්ෂාව සහ අධ්‍යාපනය සම්බන්ධයෙන් භාරකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහනක් විදේශ රැකියා ප්‍රවර්ධන නිලධාරින්ගේ සම්බන්ධීකරණයෙන් 2025.06.20 දින ප.ව.01.00ට මෙම කාර්යාලීය ශ්‍රවණාගාරයේදී පැවැති අතර මෙම අවස්ථාවට ප්‍රාදේශිය ලේකම්තුමා,පරිපාලන ග්‍රාම නිලධාරි,ලුණුගල පොලිස් ස්ථානයේ නිලධාරින්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ නිලධාරින් හා දිස්ත්‍රික් විදේශ රැකියා ප්‍රවර්ධන නිලධාරි විසින් සම්පත්දායකත්වය ලබා දෙන ලදි.

## අලුත් අවුරුදු උත්සව






කොට්ටල්බැද්ද ශ්‍රී නන්ද දහම් පාසල මගින් සංවිධානය කළ 2025.04.06 දින පැවති අලුත් අවුරුදු උත්සවය හා ශ්‍රී ජිනානන්ද දහම් පාසල මගින් සංවිධාය කළ අලුත් අවුරුදු උත්සවය සංස්කෘතිය පවරාදීම වෙනුවෙන් දහම් පාසල් දරුවන්ගේ සහභාගිත්වයෙන් 2025.04.20 දින පැවත්විණි.

## පිංඩපාත චාරිකාව




මියන්මාරයේ භූකම්පනය හේතුවෙන් විපතට පත් ජනතාවට මුදලින් ආධාර කිරීම පිණිස ලුණුගල ශාසනාරක්ෂක බල මණ්ඩලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් සංවිධානය කළ පිංඩපාත චාරිකාව 2025.04.09 වන දින පැවැත්විණි.

## දහම් දරුවන් බිහිකිරීම...




අලගොළගල ශ්‍රී සිද්ධාර්ථ දහම් පාසලේ පැවති සීල සමාදාන හා ධර්ම දේශනා වැඩසටහන මෙම වැඩසටහන තුළින් බෝසත් දරුවන් බිහිකිරීම සඳහා අවශ්‍ය මගපෙන්වීම සිදු කරන ලදි.

# පරිසර හා ඉඩම්

## වැසි වනාන්තර සංරක්ෂණය





උඩකිරුව වසමේ හොරගොල්ල රක්ෂිතය ආශ්‍රිතව පවතින ආක්‍රමණික ශාකයක් වන නයිලෝන් බෝවිටියා ශාකය පෞද්ගලික ඉඩම් කොටස් මිලදී ගෙන වැසි වනාන්තර ලෙස පිළිබඳව සිදු කළ දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා වැසි සංරක්ෂණය කිරීම උදෙසා වැසි වනාන්තර භාරය විසින් සිදු වනාන්තර භාරය හා සම්බන්ධව කටයුතු කරන කෙරෙන ව්‍යාපෘතියට අදාළව 2025.04.05.දින උඩකිරුව සාමාජිකයන්ගේ ආරාධනයෙන් ප්‍රාදේශීය ලේකම් තුමා,වසම් විහාරස්ථානයේ දී උඩකිරුව හොරගොල්ල රක්ෂිතය හා එහි භාර ග්‍රාම නිලධාරී, සංවර්ධන නිලධාරි හා පරිසර නිලධාරි වටිනාකම පිළිබඳව, උඩකිරුව ප්‍රදේශයේ ව්‍යාප්තව යන සම්බන්ධ විය.

## ප්‍රාදේශීය ළමා සභාව




ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරිනිය විසින් සංවිධානය කළ ප්‍රාදේශීය ළමා සභාව 2025.04.02 දින ප්‍රාදේශීය ලේකම් කාර්‍යාලයේදි පැවැත්වූ අතර එහිදී ප්‍රාදේශීය ළමා සභාවේ දරු දැරියන් උදෙසා කසළ නිසි පරිදි බැහැර කිරීම හා නවෝත්පාදන සඳහා ඇති අවස්ථාවන් හඳුන්වාදීම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් පරිසර සංවර්ධන නිලධාරිනියගේ සම්පත් දායකත්වයෙන් පවත්වන ලදී.

## වායු දූෂණය හා එහි අහිතකර බලපෑම අවම කිරීම ...






ජූනි මස 05 වන දිනට යෙදෙන ජගත් පරිසර දිනයට සමගාමීව සතිය තුළ මැයි මස 31 වන දින "වායු දූෂණය හා එහි අහිතකර බලපෑම අවම කිරීමේ දිනය" ලෙස නම් කර ඇත. වායු දූෂණය හා එහි අහිතකර බලපෑම අවම කිරීම තේමා කරගත් වාහන දුම් පරීක්ෂාව හා රියදුරන් දැනුවත් කිරීමේ විශේෂ වැඩසටහනක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය ECO + පරිසර මිතුරු සංසදයේ මූලිකත්වයෙන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වායු විමෝචන භාරකාර ප්‍රකාශයට පත්කර ඇති පරිසර ඒකකයේ නිලධාරීන්ගේ සම්පත් දායකත්වයෙන් ලුණුගල පොලිස් ස්ථානය, ලුණුගල ප්‍රාදේශීය සභාව හා ලුණුගල වෙළඳ ප්‍රජාවගේ අනුග්‍රහය හා සහයෝගය මත 2025.05.30 වන දින ලුණුගල ජයතිලක ක්‍රීඩාංගනයේ දී සාර්ථකව පවත්වන ලදී. මෙහිදි වාහන 112 ක ප්‍රමාණයක් පරීක්ෂාවට හා දැනුවත් කිරීමට ලක් කෙරිණි.

# පරිසර හා ඉඩම්

## ජෛව විවිධත්ව සංරක්ෂණය ...





ජූනි මස 05 වන දිනට යෙදෙන ජගත් පරිසර දිනයට සමගාමීව ප්‍රකාශයට පත්කර ඇති පරිසර සතිය තුළ ජූනි මස 02 වන දින " ජෛව විවිධත්ව සංරක්ෂණ දිනය" ලෙස නම් කර ඇත. මෙහි දී ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ECO + පරිසර මිතුරු සංසදයේ යෝජනාවක් මත උඩකිරුව " කිරිඔය" ආශ්‍රිතව සංරක්ෂණ වැඩසටහනක් සිදු කිරීමට තීරණය විය. එහිදි කිරිඔය ආශ්‍රිතව සිදුකර ඇති අනවසර පතල් කැණීම් හේතුවෙන් විනාශ වී ඇති ඉවුරු කොටස හා ඒ අවට ප්‍රදේශය, මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ පූර්ණ මැදිහත් වීම මත පතල් වලවල් වසා දමා ඒ ආශ්‍රිතව කුඹුක් හා මී පැළ රෝපණය කිරීම 2025. ජූනි මස 02 වන දින සිදු කෙරිණි. මේ සඳහා උඩකිරුව විහාරාධිපති ස්වාමීන් වහන්සේ,ලුණුගල ප්‍රාදේශීය ලේකම් එස්. පුවනේන්ද්‍රන් මහතා ඇතුළු ECO + පරිසර මිතුරු සංසදයේ සාමාජිකයින්, මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂතුමා ඇතුළු නිලධාරින්, ලුණුගල පොලිස් ස්ථානයේ නිලධාරින්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරින් හා ග්‍රාමීය ප්‍රජාව එක්ව සර්ථකව අවසන් කරන ලදි.

## ජලය හා ජල මූලාශ්‍ර සංරක්ෂණය ...

ජූනි මස 05 වන දිනට යෙදෙන ජගත් පරිසර දිනයට සමගාමීව ප්‍රකාශයට පත්කර ඇති පරිසර සතිය තුළ ජූනි මස 03 වන දින " ජලය හා ජල මූලාශ්‍ර සංරක්ෂණ දිනය" ලෙස නම් කර ඇත. මෙහි දී ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ECO + පරිසර මිතුරු සංසදයේ සංවිධානයෙන් "සුමුදුගම වැව" හා ඒ අවට මාර්ගයේ අක්‍රමවත් අයුරින් බැහැර කර තිබූ ප්ලාස්ටික්, පොලිතීන් වැනි අපද්‍රව්‍ය ඉවත් කිරීම 2025 ජූනි මස 03 වන දින සිදු කෙරිණි. මේ සඳහා ලුණුගල ප්‍රාදේශීය ලේකම් එස්. පුවනේන්ද්‍රන් මහතා ඇතුළු ECO + පරිසර මිතුරු සංසදයේ සාමාජිකයින්, ලුණුගල ගොවිජන මධ්‍යස්ථායේ ගොවිජන සංවර්ධන නිලධාරිතුමිය ඇතුළු නිලධාරින්, ලුණුගල පොලිස් ස්ථානයේ නිලධාරින්, ලුණුගල පශු වෛද්‍ය කාෂීලයේ නිලධාරීන්, ජනතාපුර විද්‍යාලයේ පරිසර නියමු දරුවන්, සුමුදුගම පෙර පාසලේ දරුවන් හා ගොවි සමිති සමජිකයින් එක්ව සර්ථකව අවසන් කරන ලදි.






## සොබාදහර






ජගත් පරිසර දිනය නිමිත්තෙන් ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විශේෂ වැඩසටහනක් 2025.06.05 වන දින පවත්වන ලදි. එහිදී පරිසර මිතුරු සංසදය විසින් "සොබාදහර" පරිසර කෘතිය එළිදැක්වීම, පාරිසරික මෙහෙවර අගය කිරීම උදෙසා සමරුඵලක පිළිගැන්වීම, චිත්‍ර රචනා පෝස්ටර් තරග ජයග්‍රහකයන්ට සහතික හා තිළිණ ප්‍රධානය, පරිසරහිතකාමී නිෂ්පාදන ඇගයීම, ප්‍රදර්ශනය හා අලෙවිය, චිත්‍ර ප්‍රදර්ශනය ආදී විශේෂාංග රාශියකින් යුක්ත වූ අතර මෙ සඳහා පල්ලෙකිරුව විහාරස්ථානයේ විහාරාධිපති පූජ්‍ය මඩුගස්තලවේ ලංකානන්ද ස්වාමීන් වහන්සේ, කොට්ඨාසයේ සියලුම රාජ්‍ය ආයතන නියෝජනය කරමින් නිලධාරී මහත්ම මහත්මීන්, වර්ල්ඩ් විශන් ආයතනයේ කළමනාකරු ඇතුළු නිලධාරීන්, කොට්ඨාසයේ පාසල් නියෝජනය කරමින් ගුරු මහත්ම මහත්මීන් හා ශිෂ්‍ය ශිෂ්‍යාවන්, දෙමාපියන් හා ප්‍රාදේශීය ලේකම්තුමා ඇතුළු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් සහභාගි විය.

# සමෘද්ධි

## සමෘද්ධි අභිමානි වෙළඳ ප්‍රදර්ශනය හා අලුත් අවුරුදු අලෙවි පොළ







සමෘද්ධි / අස්වැසුම ප්‍රතිලාභින් සවිබලගැන්වීමේ හා බද්ද වී සිටින ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන සඳහා වෙළඳපොල අවස්ථා පුළුල් කිරීම අරමුණු කර ගනිමින් හා නිෂ්පාදකයින් අතර සුහදතාවය හා එකමුතුකම ඇති කිරීමත් උත්සව සමයේදී අත්‍යවශ්‍ය හා ගුණාත්මක නිෂ්පාදන සහන මිලකට ලබා ගැනීමේ අවස්ථාව පාරිභෝගිකයින්ට උදාකරලීම අරමුණින් ලුණුගල ප්‍රාදේශිය ලේකම් කාර්යාල පරිශ්‍රෙය්දි පැවති අලුත් අවුරුදු අලෙවි පොළ 2025.04.09 දින පැවැත්විණි.

මෙ සඳහා ප්‍රාදේශිය ලේකම්තුමා ,සැලසුම් අධ්‍යක්ෂ තුමිය,මූලස්ථාන සමෘද්ධි කලමණාකරු ඇතුළු සමෘද්ධි කාර්යය මණ්ඩලය සහභාගි විය.

## දේශිය අමු ද්‍රව්‍ය ප්‍රවර්ධනය...





දේශිය අමුද්‍රව්‍ය භාවිතයෙන් වස විසෙන් තොර ආහාර පිළියෙල කිරීම පිළිබඳ අඩු ආදායම්ලාභි පවුල් දැනුවත් කිරීමේ වැඩසටහනක් 2025.05.27 වන දින උඩපංගුව ග්‍රාම නිලධාරි වසමේ ග්‍රාමීය කමිටුව විසින් සංවිධානය කළ අතර ලුණුගල අයුර්වේද නිලධාරිතුමිය විසින් සම්පත්දායකත්වය ලබාදෙන ලදි.

## පොහො දින වැඩසටහන්









වෙසක් පොහොය නිමිති කරගෙන අරවාකුඹුර සමාද්ධි සංවර්ධන නිලධාරිනියගේ ප්‍රධානත්වයෙන් හා සමෘද්ධි ප්‍රතිලාභින්ගේ දායකත්වයෙන් විහාරස්ථානය අවට පිරසිදු කිරීම හා කඩල දන්සලක් ,අලකොළගල රන්තරු ළමා සමාජය මඟින් මල් දන්සලක් පැවැත්විණි.

# සමෘද්ධි

## සීල සමාදාන වැඩසටහන



පොසොන් පොහොය නිමිති කොට ගෙන උඩකිරුව රන්තරු ළමා සමාජ දරුවන් සිල් සමාදන් කරවීමේ වැඩසටහනක් උඩකිරුව සමෘද්ධි සංවර්ධන නිලධාරිනියගේ සංවිධානයෙන් උඩකිරුව විහාරස්ථානයේදි **2025.06.08** වන දින පැවැත්විණි.

## කොඩි දිනය





මැයි **31** ජාත්‍යන්තර දුම්වැටි හා මත් විරෝධි කොඩි දිනය නිමිති කරගෙන ලුණුගල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ කොඩි අලෙවිය ආරම්බ කරමින් ප්‍රාදේශිය ලේකම්තුමාට හා නිලධාරින්ට කොඩි පැළදවීම **2025.06.02** සිදු කෙරිණි.

## ජීවනෝපාය සංවර්ධනය

ලෝක බැංකු ප්‍රජා සවිබලගැන්වීමේ වැඩසටහන යටතේ ජීවනෝපාය හා රැකියා අවස්ථා හඳුනා ගැනීම පිළිබද මහදෝව ග්‍රාම නිලධාරි වසමේ අස්වැසුම ප්‍රතිලාභීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් **2025.06.08** වන දින පැවැත්විණි.





## ප්‍රජාව සවිබල ගැන්වීම

**2025-2027**අඩු ආදායම්ලාභි ප්‍රජාව සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ වසම්භාර සමෘද්ධි සංවර්ධන නිලධාරින් දැනුවත් කිරීමේ වැඩමුළුවක් දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලයේ ප්‍රධානත්වයෙන් **2025.05.23** වන දින ලුණුගල ප්‍රාදේශිය ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේ දි පැවැත්විය.





සංවර්ධන

# සබන් නිෂ්පාදනය





සබන් නිෂ්පාදන තාක්ෂණික පුහුණු වැඩසටහනක් 2025.05.27 වන දින මඩුවත්ත වසම තුළදි පැවැත්වුණි. මෙම වැඩසටහන වසමේ ග්‍රාම නිලධාරි හා සංවර්ධන නිලධාරි විසින් සංවිධානය කළ අතර ලුණුගල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ විදාතා සංවර්ධන නිලධාරි හා ව්‍යවසායකත්ව සංවර්ධන නිලධාරි විසින් සම්පත්දායකත්වය ලබාදෙන ලදි.

## වෘත්තිය මාර්ගෝපදේශය





අධ්‍යාපනය අවසන් කර උඩපංගුව වසම තුළ ඇති සමෘද්ධි ප්‍රතිලාභී ප්‍රතිලාභීන් 16 ක් පවුල්වල තරුණ සම්බන්ධ කරගෙන තරුණියන් වෘත්තීය දැනුවත් කිරීමේ ආයතන වත යොමු වැඩසටහනක් කිරීම සඳහා පැවැත්විණි. 2025.05.27 දින

## මාර්ගෝපදේශනය









බ/ ජනතාපුර විද්‍යාලයේ 2025 අ.පො.ස සා.පෙ විභාගය සදහා පෙනී සිටින සිසුන් සදහා උ.පෙළ විෂය ධාරාව තෝරා ගැනීම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් 2025.06.17 වන දිනත් ,2025.06.19 දින බ/පල්ලේකිරුව විද්‍යාලයේදීත් නිපුණතා සංවර්ධන නිලධාරිනියගේ සම්පත්දායකත්වයෙන් පැවැත්විණි.

# සංවර්ධන

## ව්‍යවසායකයින්ට අත්වැලක්



ව්‍යවසායකත්වය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් HOPE FOR CHILDREN ව්‍යාපෘතියේ සම්බන්ධීකරණයෙන් හා ව්‍යවසාය සංවර්ධන නිලධාරී හා විද්‍යා නිලධාරියගේ සම්පත්දායකත්වයෙන් 2025.05.17 දින කොට්ටල්බැද්ද සෝල්ලන්ඩ්ස් පහල කොටස දෙමල මහා විද්‍යාලයේ දී පැවැත්විණි.

## ව්‍යවසායකයින්ගේ ව්‍යාපාරවල දියුණුව සඳහා










ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ව්‍යවසායකයින්ගේ ව්‍යාපාරවල දියුණුව සඳහා ඔවුන්ගේ නිෂ්පාදනවල ගුණාත්මක බව වැඩි කිරීමට අදාළව ලෝගෝ,විසිටින් කාඩ්,ලේබල් සැකසීමේ පුහුණු වැඩසටහන 2025.04.26 දින මාර්ගගත ක්‍රමයට සිදු කෙරිණි. මෙම වැඩසටහන සඳහා සම්පත්දායකත්වය M.Digital Solutions ආයතනයේ කේ.මලිත් නිරංජන් මහතා විසින් ලබා දුනි.

## ව්‍යාපාර සංවර්ධනය




ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ව්‍යවසායකයින්ගේ ව්‍යාපාර සංවර්ධනය උදෙසා ඔවුන්ගේ ව්‍යාපාර වලට අවශ්‍ය ගිණුම් තබා ගැනීමේ වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් 2025.04.29 දින මිල්ල බැද්ද වසමේදී පැවැත්වීය.

එහිදී ඔවුන්ගේ ව්‍යාපාරවල ගිණුම් තබා ගැනීම හා එහි වැදගත්කම පහදා දීම සිදුකෙරිණි..

## සංවර්ධන සැලසුම්





ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2025-2029 ට අදාළව ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වසම් 28 ම ආවරණය වන පරිදි සහභාගිත්ව ගැමි ප්‍රවේශය උපයෝගී කරගනිමින් ග්‍රාම සංවර්ධන සැලසුම් සකස් කිරීම 2025-05-29 දින මුළු වසම් 28 පුරා පැවැත්විණි.

මේ සඳහා වසම්භාර නිලධාරීන්,දේශපාලන නයෝජිතයින්,ප්‍රජා නායකයන් හා ප්‍රජාව සක්‍රියව තම දායකත්වය ලබා දෙන ලදී.

# සංවර්ධන

## ග්‍රාමීය සංවර්ධන වැඩසටහන





ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2025-2029 ට අදාළව, ග්‍රාම සංවර්ධන සැලසුම් සකස් කිරීම පිළිබඳව කොට්ඨාසයේ රාජ්‍ය නිලධාරින් දැනුවත් කිරීමේ වැඩමුළුව 2025.05.22 වන දින ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ශ්‍රවණාගාරයේදි බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ක්‍රමසම්පාදන බී.පී. දයාවංශ මහතාගේ ප්‍රධානත්වයෙන් සහ සම්පත් දායකත්වයෙන් පවත්වන ලදී.

වසම්භාර ග්‍රාම නිලධාරින්, ආර්ථික සංවර්ධන නිලධාරින් සමෘද්ධි සංවර්ධන නිලධාරින් සහ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරුන් සමග ප්‍රායෝගික වැඩමුළුවක් ආකාරයෙන් සිදු කෙරුණු දැනුවත් කිරීම අවසානයේ සහභාගීත්ව ගැමි විමසුමකදී නිවැරදිව සුදුසුම සංවර්ධන යෝජනා තෝරාගන්නා ආකාරය හා ප්‍රමුඛතාගත කරගන්නා ආකාරය පිළිබඳව විශේෂයෙන් දැනුවත් කරන ලදී.

## ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව

ලුණුගල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව 2025.06.11 දින බදුල්ල දිස්ත්‍රික් සමබන්ධීකරණ කමිටු සභාපති වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍ය ගරු සමන්ත විද්‍යාරත්න මහතාගේ සහ ලුණුගල කොට්ඨාස ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපති ගරු කිට්නන් සෙල්වරාජ් මහතාගේ ප්‍රධානත්වයෙන් ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය ශ්‍රවණාගාරයේදි පැවැත්වෙන ලදි. අභිනවයෙන් පත් වූ ලුණුගල ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් ඇතුළු දේශපාලන අධිකාරිය සහ කොට්ඨාසයට වග කියනු ලබන රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන වල ප්‍රධානින් ඇතුළු සියලු දෙනා පිළිගනිමින් ප්‍රාදේශීය ලේකම්තුමා කමිටුව ආරම්භ කළ අතර 2025 වසර සඳහා ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් සහ එම වැඩසටහන්වල ප්‍රගතිය සහකාර අධ්‍යක්ෂක (ක්‍රමසම්පාදන ) විසින් ඉදිරිපත් කරන ලදි. තවද විමධ්‍යගත අයවැය වැඩසටහන් ව්‍යාපෘති, ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන් ව්‍යාපෘති සහ වතු ප්‍රජාවගේ යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහනේ ව්‍යාපෘති සඳහා කමිටු අනුමැතිය ලබා ගන්නා ලදි. මෙහිදි කොට්ඨාසයේ ජනතාව මුහුනපාන ගැටලු පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරන ලදි.

















## සංවර්ධන

### කුඩා ව්‍යාපාරිකයින්ට අත්වැලක්...







කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ, බදුල්ල දිස්ත්‍රික් කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය මගින් 2025 වර්ෂයට අදාළ ව ව්‍යවසායකයන් හට තම ව්‍යාපාර ඉහළට ඔසවා තබා ගැනීමට අත්වැලක් සැපයීමේ අරමුණින් ව්‍යාපාර නිරීක්ෂණය සිදුකරන ලදී.ඔවුන්ගේ ගැටලු හඳුනාගෙන ඒවාට විසඳුම් ලබාදීමට අපේක්ෂිතය. මේ සඳහා 2025.05.09 දින බදුල්ල දිස්ත්‍රික් කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ නාලනී කන්නංගර මහත්මිය ද සම්බන්ධ විය.

### මාර්ගෝපදේශ වැඩසටහන

අ.පො.ස (සා.පෙළ) සිසුන් සඳහා වෘත්තීය ලැදියා පරීක්ෂණය හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් 2025.05.17 දින බ/ රාමක්‍රිෂ්ණා විදුහලේ දි පැවැත්වුණි.මේ සඳහා සම්පත් දායකත්වය පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිපුණතා සංවර්ධන නිලධාරී විසින් ලබාදෙන ලදි.





### මාර්ගෝපදේශ වැඩසටහන






බදුල්ල දිස්ත්‍රික් නිපුණතා සංවර්ධන ඒකකය මගින් ඌව පළාත් ක්‍රීඩා යෞවන කටයුතු සංචාරක ප්‍රවාහන සංස්කෘතික සහ පේෂකර්ම හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශය හා එක්ව බ/ ලුණුගල මධ්‍ය මහා විද්‍යාලය 11 ඉගෙනුම් ලබන සිසුන් සඳහා උසස් පෙළ විෂයයන් තෝරා ගැනීම (මනෝමිතික ක්‍රමවේදය මගින්) සහ මාර්ගෝපදේශන වැඩසටහනක් 2025.04.03 දින පැවැත්විණ....

**සංවර්ධන**

## ව්‍යවසායකයින්ට අත්වැලක් - ආර්ථිකයට ශක්තියක්...






**ඌව පළාත් සභා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ක්‍රමසම්පාදන කාර්යාලය මඟින් සිදු කරනු ලබන ව්‍යවසායකත්ව ණය වැඩසටහන යටතේ තෝරාගනු ලැබූ ව්‍යවසායකයින්ගේ ව්‍යාපාර සැලැස්ම සකස් කිරීම ඌව පළාත් සභා පර්සි සමරවීර ශ්‍රවණාගාරයේදී පසු ගියදා පැවැත්වුණි.**

**මේ සඳහා ලුණුගල කොට්ඨාසයේ සුදුසුකම්ලත් කොන්දේසි සපුරන ලද ඇඟළුම්,කුකුල් පාලනය,මල් වගාව යන අංශවල ව්‍යවසායකයින් සහභාගි වූ අතර මෙහිදී ප්‍රාදේශිය සංවර්ධන බැංකුව මඟින් තෝරාගනු ලැබූ ව්‍යවසායකයින් සඳහා සහන පොළිය මත මිලියනයකට ආසන්න ණය මුදලක් ලබාදීමට තීරණය කර ඇති බව ණය කමිටුව විසින් පැවසීය.**

**ව්‍යවසායකයින් දිරි ගැන්වීමත්,නව රැකියා අවස්ථා බිහිකිරීමත් මගින් රැකියා වියුක්තිය අඩු කිරීම හා කොට්ඨාසයේ තිරසාර සංවර්ධනය තුලින් ජාතික ආදායමේ කොටස්කරුවන්වීම මෙහි මූලික අරමුණු වේ.**

**මෙම වැඩසටහන සංවර්ධන නිලධාරි නලීන විජේවර්ධන මහතා විසින් සම්බන්ධීකරණය සිදු කරනු ලබයි.**





ග්‍රාමීය පරිපාලනය

# අපෙන් ගමට....












ලුණුගල සේවා පියස අවට පිරිසිදු කිරීම **2025.04.22** වන දින උඩපංගුව හා ලුණුගල වසම්වල ග්‍රාමීය කමිටු නිලධාරින්ගේ සහභාගිත්වයෙන් පැවැත්විණි.

ලුණුගල ප්‍රාදේශීය ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් හා වර්ල්ඩ් විෂන් ආයතනයේ අනුග්‍රහයෙන් කොහොනාවල ගම්වාසීන් එක්ව පවත්වනු ලැබූ **2025** සිංහල දමිළ අලුත් අවුරුදු සැමරුම් උලෙළ.









යපම්ම විහාරස්ථානයේ පොසොන් පෙරහැරට සමගාමීව ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාම නිලධාරී සංගමය විසින් පවත්වන ලද පොසොන් අයිස්ක්‍රීම් දන්සල.

# අපෙන් ගමට....






















ප්‍රතිපත්ති හා ආමිස පූජා වලට මුල්තැන දෙමින් මෙවර පොසොන් පොහොය වෙනුවෙන් ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරින් හා ප්‍රදේශයේ ධන පරිත්‍යාගශීලින්ගේ එකමුතුවෙන් ප්‍රථම වරට සංවිධානය කරනු ලැබූ ෆ්‍රයිඩ් රයිස් දන්සල ජුනි 12 වන දින කාර්යාල භූමියේදි සාර්ථකව පවත්වන ලදි.

සිරි ජයබෝධි විහාරයේ පූජ්‍ය අළකොලගල ඥානරතන ස්වාමින් වහන්සේ විසින් ධර්ම දේශනයක් පවත්වන ලද අතර දානමය පිංකමක්ද මෙහිදි සිදු කරන ලදි.















